**මහනුවර කඩවත්සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව - 2023**

-----------------------------------------------------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

මහනුවර කඩවත්සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට මහනුවර කඩවත්සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණන සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී .වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්**,** වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද ,අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේ ද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දී, අනුමැතියකින් තොරව රු.50,000,000 ක ස්ථාවර තැන්පතු මුදල් මාරු කර තිබුණ ද, එම වටිනාකම ස්ථාවර තැන්පතු බැර නොකර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශනයේ හඳුනා නොගත් ප්‍රේෂණ ලෙස අඩුකර දක්වා තිබුණි. | වැරදි නිවැරදි කිරීමට කටයුතු කරන බව | ස්ථාවර තැන්පතු නිවැරදිව ගිණුම්ගත කළ යුතුය |
| (ආ) | සභාව සතු පිච්චමල්වත්ත සන අපද්‍රව්‍ය මධ්‍යස්ථාන ඉඩම හා ගොඩනැගිල්ලෙහි රු.5,033,004 ක වටිනාකම සහ බෝවලවත්ත පොදු ඉඩමෙහි රු.100,000 ක වටිනාකම් ප්‍රාග්ධනීත කර නොතිබුණු අතර, තැන්නේකුඹුර පැරණි පුස්තකාල ගොඩනැගිල්ලේ වටිනාකම රු.538,083 ක් වැඩිපුර ප්‍රාග්ධනගත කර තිබුණි. | - එම - | ඉඩම් හා ගොඩනැගිලි ප්‍රාග්ධනීත කළ යුතුය |
| (ඇ) | සමාලෝචිත වර්ෂයට අදාළ මුද්දර ගාස්තු ආදායම රු.57,023,351 ක් වුව ද, එය මූල්‍ය ප්‍රකාශනවල රු.55,356,684 ක් ලෙස දක්වා තිබීමෙන් ආදායම රු.1,666,667 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | - එම - | ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය |
| (ඈ) | කසළ කළමනාකරණයට ඉඩමක් මිලදී ගැනීම ලෙස දක්වා රු.26,000,000 ක් වසර 05 ක සිට ණයහිමියන් ලෙස දෝෂ සහගතව දක්වා තිබුණි. | - එම - | ණයහිමියන් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය |

1.6.2 **නොසැසඳු පාලන ගිණුම් හෝ වාතර්ා**

| **විෂයය** | | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම් විෂයයන් 05 ක් හා වගකීම් විෂයයන් 02 කට අදාළ ශේෂයන් ඊට අදාළ උපලේඛන හා ලේඛන සමඟ සැසඳීමේ දී, රු.1,385,256 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | වෙනසට හේතු සොයා බලා නිවැරදි කළ යුතුය |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු වරිපනම් ආදායම් ගිණුම අනුව රු.15,996,887 ක ලැබිය යුතු ශේෂයක් පැවතිය ද, පරිගණක පද්ධති මෘදුකාංගය අනුව ලැබිය යුතු වරිපනම් ශේෂය රු.15,304,742 ක් වූයෙන්, රු.692,145 ක වෙනසක් නිරීක්ෂණය විය. | - එම - | - එම - |
| (ඊ) | නාගරික සංවර්ධන අධිකාරී ආයෝජන ගිණුමේ ශේෂය රු.12,596,604 ක් හා නාගරික සංවර්ධන තැන්පතු ගිණුමේ ශේෂය රු.15,049,898 ක් වීමෙන්, ගිණුම් ශේෂ අතර රු.2,453,294 ක වෙනසක් නිරීක්ෂණය විය. | මෙම වෙනස සොයා බලා වාර්තා කරන බව | ගිණුම් ශේෂ නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය |

1.6.3 **විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.8,894,890 ක වත්කම් විෂයයන් 02 කට අදාළ ලේඛන හා උපලේඛන ඉදිරිපත් නොකිරීම හේතුවෙන්, විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | ගිණුම් ශේෂ සනාථ කර ගැනීමට අවශ්‍ය උපලේඛන නිවැරදිව පවත්වා ගත යුතුය |

1.7 **අනුකූල නොවීම්**

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | **1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත** | | | |
| (i) | 132 | විෂයය භාර අමාත්‍යවරයාගේ ලියවිල්ලකින් පූර්ව අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේ දී, ප්‍රතිලාභීන් 08 කට නිවාස ආධාර ලබා දීම සඳහා රු.1,096,808 ක් වැය කර තිබුණි. | ඉදිරියේ දී අනුමැතිය ලබා ගෙන කටයුතු සිදු කරනු ලබන බව | ආධාර ලබා දෙන්නේ නම්, පූර්ව අනුමැතිය ලබා ගත යුතුය |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | 154(1) | ඉඩම් අනුබෙදුම් 02 ක ඉඩම් කොටස් 60 කින් විකුණුම් වටිනාකම සියයට 01 ක ආදායමක් ලබා ගත යුතු වුවත්, තාවකාලික තක්සේරු මත ආදායම ලබා ගැනීම හේතුවෙන්, විකුණුම් වටිනාකමින් ඉතිරි මුදල් රු.2,220,161 ක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාළ ආයතන වෙත ලිඛිතව දැනුම් දී අදාළ අය කිරීම් සිදු කිරීමට කටයුතු කරන බව | පනතේ විධිවිධාන අනුව, කටයුතු කර ආදායම් අය කර ගත යුතුය |
| (ආ) | **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | | |
| (i) | 2020 ඔක්තෝබර් 16 දිනැති අංක 18/2020 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා ආයතන සංග්‍රහයේ 01 වැනි කාණ්ඩයේ XIV වැනි පරිච්ඡේදයේ 4.1 හා 4.1.1 වගන්ති | රාජ්‍ය නිලධාරීන්ට තම සේවා අවශ්‍යතාවය අනුව, පවත්වනු ලබන රාජ්‍ය භාෂා ප්‍රවීණතා පාඨමාලාවට සහභාගී වූ නිලධාරීන් 16 දෙනෙකුට ගමන් වියදම් හා අතිකාල දීමනා රු.693,481 ක් ගෙවා තිබුණි. | අදාළ නිලධාරීන්ගෙන් අය කර ගැනීමට කටයුතු කරන බව | ආයතන සංග්‍රහය හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය |
| (ii) | 2023 මැයි 08 දිනැති අංක 07/2023 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | පළාත් පාලන ආයතන පිළිබඳ ඡන්ද විමසීම සඳහා අපේක්ෂකයින් ලෙස නාම යෝජනා භාර දී, තිබුණු නිලධාරියෙක් යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාන මාරු නොකර, ප්‍රාදේශීය සභාව තුළම සේවයේ යොදවා තිබුණි. | මෙම නිලධාරියාට පවරා ඇති රාජකාරි කටයුත්ත අවසන් වූ වහාම කාර්යාලයේ සේවයෙන් නිදහස් කරන බව | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය |
| (ඇ) | **වෙනත් චක්‍රලේඛ** | | | |
| | 2023 මාර්තු 24 දිනැති හා අංක 3/4/10 පොදු දරන පළාත් පාලන කොමසාරිස්ගේ ලිපියේ 5.10 වගන්තිය | ප්‍රාදේශීය සභාවක ප්‍රසම්පාදන මණ්ඩලය සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගණකාධිකාරී සම්බන්ධ කර ගත යුතු වුවත්, ප්‍රාදේශීය සභාව විසින් සමාලෝචිත වර්ෂයේ දී, ගෙන තිබුණු ප්‍රසම්පාදන තීරණ 11 ක් සඳහා ප්‍රසම්පාදනය කර ගෙන තිබුණ ද, ගණකාධිකාරීවරයෙකු සම්බන්ධ කර ගෙන නොතිබුණි. | මින් ඉදිරියට සියළු ප්‍රසම්පාදන තීරණ ගැනීම් ගණකාධිකාරිවරයකු සම්බන්ධ කර ගනිමින් සිදු කරන බව | චක්‍රලේඛ උපදෙස්වලට අනුව කටයුතු කළ යුතුය |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.133,729,043 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.83,770,465 ක් විය.

## 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 ඔක්තෝබර් 28 දිනැති අංක 2020/06 දිනැති මධ්‍යම පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 02.2(1) ඡේදය අනුව, කටයුතු නොකර, කමිටු අනුමැතියකින් රු.50,000,000 ක ස්ථාවර තැන්පතුවක් 2023 දෙසැම්බර් 21 දින නිදහස් කර ගෙන තිබුණි. | ඉදිරියේදී එවැනි අත පසු වීම් සිදු නොවීමට කටයුතු කරන බව | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 27,205,760 | 27,565,562 | 29,246,636 | 16,072,019 | 27,214,820 | 26,089,341 | 26,922,888 | 17,753,093 |
| (ii) | කුලී | 2,022,332 | 3,676,872 | 3,500,790 | 176,082 | 1,117,932 | 2,124,463 | 2,181,263 | -- |
| (iii) | බලපත්‍ර ගාස්තු | 3,048,050 | 10,188,189 | 9,833,202 | 413,236 | 2,215,750 | 2,409,812 | 7,566,885 | 58,249 |
| (iv) | වෙනත් ආදායම් | 159,077,400 | 168,643,362 | 99,425,240 | 210,999,458 | 128,011,372 | 112,908,692 | 127,782,436 | 141,781,336 |
| | එකතුව | 191,350,542 | 210,073,985 | 142,005,868 | 227,660,795 | 158,559,874 | 143,532,308 | 164,453,472 | 159,592,678 |

### 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමස්ත ආදායම් ප්‍රභවයන්ගෙන් ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති හිඟය රු.159,592,678 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයේ එම වටිනාකම රු.227,660,795 ක් වීම හේතුවෙන් හිඟ ආදායම සියයට 43 කින් ඉහළ ගොස් තිබුණි. | අදාළ අය කිරීම් කඩිනමින් සිදු කරන බව | හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතුය |
| (ආ) | **වරිපනම් හා බදු** | | |
| | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ හිටි රු.15,996,887 ක වරිපනම් ශේෂය තුළ එක ඒකකයක හිඟය රු.5,000 ක් ඉක්ම වූ දේපළ 793 කින් රු.7,222,097 ක් හිඟයක් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය ප්‍රකාරව කටයුතු කර අය කර නොතිබුණි. | හිඟ වරිපනම් ආදායම් එකතු කර ගැනිම සඳහා කටයුතු කරන බව | හිඟ වරිපනම් අය කර ගැනීමට කටයුතු කළ යුතුය |

(ඈ) **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| | | |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.1,626,233 ක් හා මුද්දර ගාස්තු රු.198,023,051 ක් විය. ලැබිය යුතු මුද්දර ගාස්තු වටිනාකමින් වසර 01 ත් 05 ත් අතර වටිනාකම රු.110,583,740 ක් වූ අතර, වසර 05 ට වඩා වැඩි ශේෂය රු.32,082,625 ක් විය. | අය විය යුතු ගාස්තු අය කර ගැනීමට කටයුතු කරන බව | හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතුය |

2.4 **අධිභාර**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු අයවලුන්ට එරෙහිව මවිසින් ඉකුත් වර්ෂය තුළ දී රු.262,608 ක අධිභාරයක් පනවා තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසාන දිනට එම මුදල් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි . | අදාළ අය කිරීම් සිදු කරන බව | අධිභාර අය කර ගැනීමට කටයුතු කළ යුතුය |

3. **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 93 සිට 95 දක්වා වගන්තිවලට අනුව, මළ ප්‍රවාහනය සහ කසළ ශෝධනය ප්‍රාදේශීය සභාව විසින් ඉටු කළ යුතු වුවත්, ගලි රථයක් සපයා ගැනීමට හා මළ පිරිපහදු ඒකකයක් ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි. | මළ පිරිපහදු ඒකකයක් ආරම්භ කිරීමට තරම් සභාව සතු සුදුසු ඉඩම් නොමැති අතර, ඒ සඳහා අවශ්‍ය තාක්ෂණය හා කම්කරුවන් අවශ්‍ය වන බව | මහජන සෞඛ්‍ය පවත්වා ගෙන යාම වෙනුවෙන් පනතේ කාර්යයන් ඉටු කළ යුතුය |

3.2 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 02 ක එකතුව රු.20,407,814 ක් වූ අතර, ඉන් වසර 01 ත් 05 ත් අතර කාලයක් ඉක්මා තිබුණු ශේෂය රු.3,692,872 ක් හා වසර 05 ක කාලයක් ඉක්මවා තිබුණු ශේෂය රු.16,714,942 ක් අය කර නොතිබුණි. | ඉදිරියේ දී අය කර ගැනීමට කටයුතු කරන බව | ලැබිය යුතු ශේෂ අය කර ගැනීමට කටයුතු කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට පැවති ණයහිමි ශේෂ 02 ක එකතුව රු.147,630,635 ක් වූ අතර, හා වසර 01 ත් 05 ත් අතර කාලයක් ඉක්මා තිබුණු රු.53,325,108 ක ශේෂයක් හා ඉන් වසර 05 ක කාලයක් ඉක්මවා තිබුණු රු.5,872,639 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේ දී නිරවුල් කිරීමට කටයුතු කරන බව | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය |

3.3 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2014 නොවැම්බර් 28 දිනැති අංක 1891 දරන ගැසට් පත්‍රයේ 12 – 788 කොටසේ මුළු සභා බල ප්‍රදේශයම දියුණු කළ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කර බල ප්‍රදේශයේ පිහිටි සියලු දේපළ තක්සේරු කර වරිපනම් බදු අය කිරීමේ කටයුතු 2015 වර්ෂයේ ආරම්භ කරන බව දන්වා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට වසර 09 ක් ගත වී ඇතත්, දේපළ තක්සේරු කිරීමේ කටයුතු සිදු කර වරිපනම් බදු අය කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් සභා අරමුදලට විශාල වරිපනම් බදු ආදායමක් අහිමි වී තිබුණි. | අදාළ තක්සේරුව සිදු කර දුන් වහාම අදාළ අය කිරීම් සිදු කරන බව | කාලීනව දේපළ තක්සේරු කිරීම් සිදු කර වරිපනම් බදු අය කිරීමට කටයුතු කළ යුතුය |
| (ආ) | ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මඟින් හන්තාන එස්ටේට් නිවාස යෝජනා ක්‍රමයේ රෙසිඩන්සීස් නිවාස ව්‍යාපෘතියට අක්කර 12 රූඩ් 03 පර්චස් 8.1 ක මුළු භූමිය ඉඩම් කැබලි 40 කට අනුබෙදුම් කර වෙන්දේසියේ විකිණීමේ දී, සංවර්ධනයට පෙර වෙළඳ පොළ වටිනාකම මත සියයට 01 ක ආදායම ලෙස රු.3,072,000 ක් ලබා ගෙන තිබුණ ද,මෙම ඉඩම් කොටස් විකිණීමෙන් පසුව විකුණුම් වටිනාකම හා ඇස්තමේන්තු අගය මත අය කළ බදු අතර, වෙනස හඳුනා ගෙන අය කර නොතිබුණි. | වෙනස හඳුනාගෙන අනුකූලතා සහතිකය ලබා ගන්නා අවස්ථාවේ අදාළ මුදල අයකිරීමට කටයුතු කරන බව | සියයට 01 බදු ආදායම නිවැරදිව ගණනය කර අය කළ යුතුය |
| (ඇ) | හන්තාන එස්ටේට් නිවාස යෝජනා ක්‍රමයේ පොදු ඉඩම සඳහා අක්කර 01 පර්චස් 6.3 ක් ක්‍රීඩාංගණය සහිත භූමිය ප්‍රජා හා විනෝද කටයුතු සඳහා ප්‍රාදේශීය සභාවට දීමට යෝජිතව තිබුණ ද, මෙම ක්‍රීඩා පිටිය දැනටත් ගම්වාසීන් පරිහරණය කරන මෙම අනුබෙදුම් කිරීමට පෙර සිට භාවිතා කරන ක්‍රීඩා පිට්ටනියක් බව නිරීක්ෂණය වූයෙන්, මෙම අනුබෙදුම සඳහා පොදු කටයුතු වෙනුවෙන් ලබා ගත් සියයට 10 ක බිම් කොටස් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පෙන්වා දී ඇති පරිදි අදාළ බිම් කොටස කඩිනමින් ලබා ගැනීමට කටයුතු කරන බව | පොදු පහසුකම් සඳහා බිම් කොටස් ලබා ගැනීමට කටයුතු කළ යුතුය |

**3.4 දෘශ්‍ය අක්‍රමිකතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභා අරමුදල් මඟින් අඩු ආදායම්ලාභීන් වෙත බෙදා දීම සඳහා ලබා ගත් රු.39,965 ක පටක රෝපණ මැෂිමක් සභාවේ සේවකයෙකුට ලබා දී තිබුණු අතර, ප්‍රතිලාභීන් දෙදෙනෙකුට ලබා දී තිබුණු රු.63,800 ක් වටිනා ඕලොක් මැෂින් 02 ක් නිකුත් කළ පුද්ගලයින් සොයා ගැනීමට නොහැකි වීමෙන් අක්‍රමිකතාවයක් සිදු වී තිබුණු බව නිරීක්ෂණය විය. | ස්වයං රැකියාවල නිරත පුද්ගලයින් වෙත මහ සභාවේ අනුමැතිය මත උපකරණ ලබා දි ඇති බව | ප්‍රතිලාභීන් නිවැරදිව හඳුනා ගෙන ආධාර ලබා දිය යුතුය |

**3.5 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභා බල ප්‍රදේශයේ පැවති ඉඩම් වෙන්දේසිවලින් පොදු කටයුතු සඳහා පවරා ගත් වටිනාකම රු.9,615,052 ක ඉඩම් කොටස් 07 ක් හා වටිනාකම ගණනය කර නොමැති ඉඩම් කොටස් 04 ක් නිෂ්කාර්යයව පැවතුණි. | අදාළ කරුණ පිළිබඳව සොයා බලා වාර්තා කරන බව | ඉඩම අරමුණුගත කාර්යයන් සඳහා යොදවා ගත යුතුය |
| (ආ) | සභාව සතු රු.1,400,000 ක කම්පැක්ටර් ට්‍රේලරයක්, වටිනාකම තක්සේරු නොකරන ලද ට්‍රේලරයක් හා රු.648,716 ක වටිනාකම වූ ජල උපකරණ තොගයක් වසර 06 ක සිට නිෂ්ක්‍රීයව හෝ ඌණ උපයෝජිතව පැවතුණි. | මේ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදු කරන බව | අදාළ ක්‍රියාමාර්ග කඩිනමින් අවසන් කළ යුතුය |

**3.6 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම** | | |
| (i) | සභාව පරිහරණය කරනු ලබන පරිත්‍යාගයක් ලෙස ලැබී තිබුණු අක්කරයකට වඩා වැඩි වපසරියකින් යුත් දඹවෙල සුසාන භූමිය පිහිටි ඉඩමේ වැට මායිම් සකස් කර ආරක්ෂාව තහවුරු කර නොතිබුණු අතර, මෙම සුසාන භූමි ඉඩම බාහිර පුද්ගලයෙකු අනවසරයෙන් අල්ලා ගෙන නිවසක් ඉදිකර ගෙන තිබුණ ද, අනවසර ඉදිකිරීම සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගෙන නොතිබුණි. | අනවසර ඉදිකිරිම සම්බන්ධයෙන් ඉදිරියේදි කටයුතු කර ආරක්ෂාව තහවුරු කරන බව | ඉඩම්වල අයිතිය පවරා ගත යුතු අතර, අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය |
| (ii) | සභාව සතු මුද්‍රණ යන්ත්‍රයක් හා ටැබ් යන්ත්‍රයක් සභාවේ සභිකයෙකු වෙත ලබා දී තිබුණු අතර, සභාව විසුරුවා හැරීමෙන් පසු මෙම යන්ත්‍ර නැවත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ලිඛිතව දැනුවත් කර මෙම ටැබ් යන්ත්‍රය හා මුද්‍රණ යන්ත්‍රය භාර දීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස දන්වා ඇති බව | යන්ත්‍ර නැවත සභාව වෙත ලබා ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය |

| | | | |
|---|---|---|---|
| (iii) | ප්‍රාදේශීය සභාව සතු හිරුස්සගල එස්ටේට් රිච්මන්ඩ් හිල් එස්ටේට් නැමැති ඉඩමේ පොදු කටයුතු සඳහා ලබා දුන් ඉඩමෙන් පර්චස් 1.8 ක බිම් ප්‍රමාණයක පැරඩයිස් පාර්ක් නැමැති හෝටලයේ අයිතිකරු පිහිනුම් තටාකයක් ඉදිකර ඇති බව නිරීක්ෂණය වේ. මෙම ඉඩම් කොටස නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නැවත මෙම ඉඩම මැනීමට තීරණය වූ බව | ඉඩම නිරවුල් කර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය |
| (ආ) | **නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම** | | |
| | ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ විදුලි සෝපානය 2015 අප්‍රේල් මස ස්ථාපිත කර තිබුණු අතර, 2023 මැයි 22 දින සිට අක්‍රීයව පැවතුණි. මේ සඳහා 2023 වර්ෂයේ දී, එකතුව රු.204,160 ක වියදමක් දරා විදුලි සෝපානය අලුත්වැඩියා සිදු කර තිබුණ ද, 2024 පෙබරවාරි 21 විගණන දින වන විටත් එම යන්ත්‍රය අක්‍රීයව පැවතුණි. | ගිවිසුම් ගාස්තු හා බැටරියට අදාළ ගෙවීම් පමණක් සිදු කර ඇති අතර, නව සේවා ගිවිසුමක් අත්සන් කර අළුත්වැඩියා කටයුතු සිදු කරන බව | විදුලි සෝපානය අළුත්වැඩියා කිරීමට කටයුතු කළ යුතුය |

## 3.7 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ පරිශ්‍ර 05 ක සවි කර තිබුණු CCTV කැමරා පද්ධතිය අළුත්වැඩියාව සඳහා සැපයුම්කරුවන් 03 ක් මිල ගණන් කැඳවා අඩුම මිල ඉදිරිපත් කළ සැපයුම්කරුගෙන් රු.543,550 ක් වැය කර අළුත්වැඩියාව සිදු කර තිබුණි. ඉතිරි සැපයුම්කරුවන් දෙදෙනා ක්ෂේත්‍රය සම්බන්ධව ලියාපදිංචි සැපයුම්කරුවන් නොවන බව නිරීක්ෂණය විය. | සභාව සතුව සීසීටීවී සම්බන්ධව කිසිදු ආයතනයක් ලියාපදිංචි වී නොතිබුණු බැවින්, පරිගණක හා පරිගණක උපාංග යටතේ ලියාපදිංචි වී ඇති ආයතනයන්ගෙන් ඒ පිළිබඳ විමසීම් කළ බව | නීති, රීති හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට අනුව කටයුතු කළ යුතුය |

## 3.8 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 වර්ෂයේ දෙවන අර්ධ වර්ෂය සඳහා ගොඩනැගිලි හා මාර්ග සම්මත මිල රේටයන් සංශෝධනය කර තිබිය දී, 2023 මුල් අර්ධ වර්ෂයේ රේටයන් මත පදනම්ව ඇස්තමේන්තු සකස් කර, මාර්ග, කාණු, බෝක්කු සහ පාළම් හා වැටවල් ඉදිකිරීම ව්‍යාපෘති 28 කට රු.2,500,881 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවීම් කර ඇති මුදල එම කොන්ත්‍රාත් සමිති සඳහා ඉදිරියේ දී නිදහස් කිරීමට ඇති රඳවුම් මුදල්වලින් අය කරන බව | මාර්ග සම්මත මිල රේටය (HSR) වලට අනුකූල නොවී ඇස්තමේන්තු සෑදූ හා ගෙවීම් නිර්දේශ කළ නිලධාරීන් හඳුනා ගෙන ක්‍රියාමාර්ග ගත යුතුය |
| (ආ) | දඹවෙල ප්‍රධාන මාර්ගයේ සිට සුසානාගාරය දක්වා මාර්ගය කොන්ක්‍රීට් කිරීම - රු.2,000,000 | | |
| | මාර්ගය කොන්ක්‍රීට් කිරීමට ඇස්තමේන්තු පිළියෙල කර තිබුණ ද, අනුමත | මුල් අදියරේ දී නිශ්චිතව සියළුම වැඩ කොටස් හඳුනා ගැනීම අපහසු වූ | |

| | | | |
|---|---|---|---|
| | ඇස්තමේන්තුවට පරිබාහිරව කටයුතු කර පෞද්ගලික ඉඩම් හිමියකුගේ ඉඩමේ මායිමට දිග මීටර් 17.6 ක ප්‍රමාණයේ ආරක්ෂිත බැම්මක් ඉදිකරමින් පැවතුණි. එසේම, මාර්ගය ආරම්භයේ මීටර් 200 ක් පමණ අඩි 12 ක් ප්‍රමාණයේ පළලින් ද මීටර් 200 න් පසු අඩි 24 ක පමණ ප්‍රමාණයට මාර්ගය පුළුල් කරමින් ඒ සඳහා නැවත රු.3,000,000 ක් ඇස්තමේන්තු සකස් කර ගිවිසුම්ගත වී තිබුණි. මේ සඳහා රු.1,918,052 මුදලක් ගෙවීම් කර ඇත. අවශ්‍යතාවයකින් තොරව මාර්ගය අනුමත ප්‍රමාණයට වඩා වැඩියෙන් ඉදිකර ඒ වෙනුවෙන් රු.3,820,000 ක් වැය කිරීම නිෂ්ඵල වියදමක් වී තිබුණි. | බැවින් බැවුම් සහිතව කොන්ක්‍රීට් අතුරා ගමනාගමනය අපහසු වන බැවින්, ඒකාබද්ධ ක්ෂේත්‍ර පරීක්ෂා මත මුල් ඇස්තමේන්තුව සංශෝධනය කර මාර්ගය කොන්ක්‍රීට් ඇතිරීම මෙන්ම මාර්ගයේ කඩා ඉවත් කල යුතු ගල් කඩා ඉවත් කිරීම සඳහා ලබා ගන්නා ලද පූර්ව අනුමැතිය ඉදිරිපත් කරන බව | පූර්වයෙන් අවශ්‍යතාවය හඳුනා ගෙන කටයුතු කළ යුතුය |
| (ඇ) | ගුඩ් හෝප් හන්දියේ සිට තලපියන්නාව අම්පිටිය මාර්ගය සංවර්ධනය - රු.11,150,000 | | |
| | ප්‍රාදේශීය සභා පනතේ 24 වගන්තිය ප්‍රකාරව මාර්ගයක් පුළුල් කිරීම සඳහා මැනුම් කර ස්ථිර සළකුණු යෙදිය යුතු වුවත්, එම උපදෙස් අනුගමනය නොකර මාර්ග ඉදිකිරීම ආරම්භ කර තිබුණු අතර, 2023 මාර්තු 17 හා අංක S1/4/10 පොදු දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය ප්‍රකාරව, ඇස්තමේන්තුවක් සකස් කිරීමකින් තොරව අම්පිටිය ගහහවෙල ග්‍රාම සංවර්ධන සමිතිය සමඟ රු.5,000,000 ක මුදලකට ගිවිසුම්ගත වීමට කටයුතු කර තිබුණි. එසේම, මාර්ගය භෞතික ව පරීක්ෂාවේ දී මීටර් 03 ක පමණ පළලකින් යුතු මාර්ගය මීටර් 06 ක පමණ පළල් වන ලෙස පුළුල් කර බැමි බැඳීමට සැලසුම් කර තිබුණු අතර, මාර්ගය පුළුල් කිරීමේ දී, සමහර ඉඩම්හිමියන් ඉඩම් ලබා නොදීම හේතුවෙන් එම ස්ථානවලින් පුළුල් කිරීමට නොහැකිව තිබුණු බවත් විගණනයට නිරීක්ෂණය විය. | විගණනයෙන් පෙන්වා දී ඇති කරුණු පිළිගන්නා අතර, ඉදිරියේ දී සිදුකරනු ලබන සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් වැරදි අඩුපාඩු සිදු නොවීමට වගබලා ගන්නා බව | වෘත්තීය සැළකිල්ලෙන් හා විධිමත් ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට කටයුතු කළ යුතුය |
| (ඈ) | ඔගස්ටාවත්ත සිටි මිෂන් වටරවුම් මාර්ගයේ ප්‍රියන්ති මහත්මියගේ නිවස අසළ මාර්ගය රු.1,000,000 | | |
| i. | මාර්ගයේ කොන්ක්‍රීට් තට්ටුව අඟල් 05 ක ප්‍රමාණයට දැමිය යුතු වුවත්, මාර්ගයේ ස්ථාන 02 කින් පළුදු කර බැලීමේ දී ඝනකම අඟල් 2.75, 3.00 ක ප්‍රමාණයේ විය. ඒ අනුව, නිසි ප්‍රමිතියට මාර්ගය ඉදිකර නොමැති බවත්, මාර්ගයේ ඝනකම අඩුවීම හේතුවෙන් ගල් ගැලවී තිබුණු බව ද නිරීක්ෂණය විය. | තාක්ෂණ නිලධාරි වාර්තා මත පදනම්ව මෙම මාර්ගය යථාවත් කරන ලෙස අදාළ කොන්ත්‍රාත් සමිතිය වෙත දැනුවත් කිරීමක් සිදු කර ඇති බව | ඇස්තමේන්තුගත ප්‍රමිතියට මාර්ගය ඉදිනොකිරීම සම්බන්ධව ක්‍රියාමාර්ග ගත යුතුය |
| ii. | මෙම මාර්ගයේ කොන්ක්‍රීට් තත්ත්ව පරීක්ෂාවන් 03 ක් සිදු කර තිබුණු අතර, එම | නැවත වතාවක් පරීක්ෂා කිරීමට නිර්දේශ කිරීමට සිදු වූ බව තාක්ෂණ නිලධාරි විසින් වාර්තා කර ඇති බව | ඇස්තමේන්තුගත ප්‍රමිතියට මාර්ගය ඉදිනොකිරීම සම්බන්ධව ක්‍රියාමාර්ග ගත යුතුය |

| | | | |
|---|---|---|---|
| | පරීක්ෂණයන්ට අනුව, මාර්ගයේ ප්‍රමිතිය දුර්වල මට්ටමක පැවතුණි. | | |
| iii. | මෙම මාර්ගය 2023 පෙබරවාරි 27 වන දින ගිවිසුම්ගත වී මාස 03 ක් තුළ එනම්, 2023 මැයි 27 වන දින නිම කළ යුතු වුවත්, එකී කාලය තුළ ව්‍යාපෘතිය නිම කර නොතිබුණි. 2023 අවසාන අර්ධ වර්ෂය තුළ මාර්ග සම්මත මිල ගණන් අඩු වී තිබියදීත්, 2023 ජූලි 23 වන දින ආරම්භ කර 2023 ජූලි 29 වන දින වැඩ නිම කළ මෙම මාර්ගයට 1:2:4 මි.මි.19 කොන්ක්‍රීට් කිරීමේ දී, මාර්ග සම්මත රේට අංක ST 047 අනුව, රු.27,427.48 ක රේටය යොදාගත යුතු වුවත්, රු.31,667.71 ක රේටය භාවිතා කිරීම හේතුවෙන්, ඝන මීටර් 26.25 කට රු.4,240.23 ක් බැගින් රු.111,306 ක් වැඩිපුර ගෙවීම් කර තිබුණි. | වැඩිපුර ගෙවා ඇති මුදල අය කරන බව | මාර්ග සම්මත රේට අනුව ගිවිසුම්ගත නොවීම සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය |

## 3.9 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවේ අනුමත කාර්ය මණ්ඩලය සහ තථ්‍ය කාර්ය මණ්ඩලය සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පුරප්පාඩු 11 ක් හා සේවක අතිරික්ත 20 ක් පැවතුණි. | අතිරික්ත නිලධාරීන් සියළු දෙනාට රාජකාරි පවරා ඇති බව හා පුරප්පාඩු සම්බන්ධයෙන් අදාළ ආයතන දැනුවත් කර ඇති බව | සේවක පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුය |
| (ආ). | මැදදුම්බර ප්‍රාදේශීය සභාවේ සේවය කළ II වන ශ්‍රේණියේ සෞඛ්‍ය කම්කරු සේවකයෙකු කිසිදු සාධාරණ හේතුවක් නොදක්වා මහනුවර කඩවත්සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශිය සභාවට වෙත අනුයුක්ත කර තිබුණි. | අනුයුත්ත කාල සීමාව අවසන් වූ පසු නැවත අනුයුත්ත කාල සීමාව දීර්ඝ කිරීමට කටයුතු නොකරන බව | අදාළ හේතු දක්වා අනුයුක්ත කිරීම් සිදු කළ යුතුය |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාන මාරු, විශ්‍රාමික හා සේවය අතහැර ගිය නිලධාරීන් 27 කගෙන් රු.1,213,233 ක සේවක ණය අය කර ගෙන නොතිබුණි. | අදාළ අය කිරීම් සිදු කිරීමට කටයුතු කරන බව | සේවක ණය අය කර ගැනීමට කටයුතු කළ යුතුය |
| (ඈ) | මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් සඳහා වන ස්ථාන මාරු ප්‍රතිපත්තිය අනුව, එකම සේවා ස්ථානයක වසර 05 කට වඩා වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධරයන් ස්ථාන මාරුවලට යටත් විය යුතු වුව ද, වසර 05 කට වඩා වැඩි කාලයක් ප්‍රාදේශීය සභාවේ සේවය කරන නිලධාරීන් 03 දෙනෙකු සඳහා ස්ථාන මාරුවීම් ලැබී ඇතත්, මුදා හැර නොතිබුණි. | නිලධාරින් මෙම සේවා ස්ථානයෙන් මුදා හැරිමට කටයුතු කරන බව | නිලධාරීන්ට නියමිත කාලයේ දී ස්ථාන මාරු ලබා දිය යුතුය |

3.10 **වාහන පද්ධතිය කළමනාකරණය**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| සභාව සතු වාහන 03 ක මයිලෝ මීටරය අක්‍රියව පවතින බවත්, ඒවා අළුත්වැඩියා කර නොතිබීමෙන් ඉන්ධන පරිභෝජනය නිසි පරිදි සිදු කර තිබේ ද යන්න විගණනයට තහවුරු නොවුණි. | වාහන 02 ක් අළුත්වැඩියා කටයුතු සඳහා නියෝජිත ආයතනය වෙත යොමු කර ඇති අතර, අනෙක් වාහනයේ මීටර් නොමැති බව නියෝජිත ආයතනය විසින් දන්වා ඇති බව | මයිලෝ මීටර් අළුත්වැඩියා කිරීමට කටයුතු කළ යුතුය |